**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - 2015**
**-------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-------------------------------------------------------------**

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පැවැත්වීම**
**---------------------------------------**

සංස්ථාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම් පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

**2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම**
---------------------------------------

සංස්ථාව විසින් අවසන්වරට පිළියෙළ කරන ලද 2013 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 5,805,009,280 |
| ජංගම වත්කම් | 161,866,142 |
| මුළු වත්කම් | 5,966,875,422 |
| බැරකම් | |
| ජංගම බැරකම් | 1,179,046,151 |
| ජංගම නොවන බැරකම් | 233,890,743 |
| මුළු බැරකම් | 1,412,936,894 |
| ශුද්ධ වත්කම් / අයිතිය | 4,553,938,529 |
| මුළු බැරකම් | 5,966,875,423 |
| | |
| මුළු ආදායම | 655,699,345 |
| මුළු වියදම | 873,483,759 |
| ඌනතාවය | 217,784,414 |

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i) මුදල් රෙගුලාසි 104 හා 110 | 2013 වර්ෂයේදී ගින්නෙන් විනාශ වී තිබූ රු.500,000 කට වැඩි අලාභ හානි සිදුවී තිබූ ගල්පීල්ල කර්මාන්ත ශාලාව හා යන්ත්‍ර සූත්‍ර සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන නිලධාරියා විසින් පරීක්ෂණය සිදුකර තිබුණු අතර ඉදිරිපත් කර තිබූ වාර්තාවෙහි ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර නොතිබුණි. තවද එම වතුයායට අයත් වාහනයක් 2013 වර්ෂයේදී ගිනි තබා විනාශ කිරීම සම්බන්ධයෙන් අලාභහානි පිළිබඳව මූලික පරීක්ෂණයක් පවත්වා ප්‍රාරම්භක වාර්තාවක් සකස් කිරීම වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීම හා අලාභහානි ලේඛනයේ ඇතුලත් කිරීම ආදී කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2013 ජනවාරි 15 දිනැති අංක 01/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වතුයායන් 8 ක වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරින් 18 දෙනෙකු සහ වතුයායන් 12 ක වයස අවුරුදු 60 ඉක්ම වූ කම්කරුවන් 142 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව මගින් පාලනය කරනු ලබන වතුයායන් 12 කට අදාලව 2014 හා සමාලෝචිත වර්ෂයේ හෙක්ටයාරයක නිමි තේ අස්වැන්න පහත දැක්වේ.

| වතුයාය | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) | හෙක්ටයාරයක නිමි තේ අස්වැන්න 2015 (Kg) | 2014 (Kg) | විචලනය (Kg) |
|---|---|---|---|---|
| ඕපල්ගල | 104 | 605 | 633 | (28) |
| ගල්පීල්ල | 235 | 641 | 629 | 12 |
| ගෝමර | 164 | 723 | 671 | 52 |
| රංගල | 215 | 698 | 549 | 149 |
| භාගල | 251 | 584 | 596 | (12) |
| කැලැබොක්ක | 583 | 608 | 506 | (102) |
| හුන්නස්ගිරිය | 208 | 590 | 469 | 121 |
| අලකොල්ල | 338 | 493 | 499 | (6) |
| මිඩ්ලන්ඩ් | 259 | 466 | 448 | 18 |
| හෙයාපාර්ක් | 192 | 214 | 274 | (60) |
| කොටගඟ | 251 | 185 | 228 | (43) |
| නිකොලොඔය | 92 | 366 | 381 | (15) |
| **එකතුව** | **2,892** | **6,173** | **5,883** | |

(i) හෙක්ටයාරයක සාමාන්‍ය ප්‍රමිත නිමි තේ අස්වැන්න දළ වශයෙන් කිලෝග්‍රෑම් 1736.5 ක් වුවත් සමාලෝචිත වර්ෂයේදී එය කිලෝග්‍රෑම් 185 සිට කිලෝග්‍රෑම් 723 ක් දක්වා ඉතා පහළ පරාසයක පැවතුණි.

(ii) සමස්ථයක් වශයෙන් සංස්ථාවේ නිමි තේ අස්වැන්න 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 5 කින් ඉහළ ගොස් ඇති නමුත් 2013 වර්ෂයට සාපේක්ෂව එම අගය සියයට 15 කින් පහළ ගොස් තිබුණි. තවද වතුයායන් 5ක නිමි තේ අස්වැන්න 2014 වර්ෂයට සාපේක්ෂව සුළු වශයෙන් ඉහළ ගොස් ඇති අතර, වතුයායන් 7 ක නිමි තේ අස්වැන්න පහළ ගොස් තිබුණි. මේ අනුව සංස්ථාවෙහි වතුයායන්හි මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය හා සඵලදායකත්වය ඉතා පහළ මට්ටමක පැවතුණි.

(iii) 2014 වර්ෂයේ නිමි තේ නිෂ්පාදනය දළ වශයෙන් කිලෝග්‍රෑම් 1,402,740 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එය කිලෝග්‍රෑම් 1,511,788 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 8කින් ඉහළ ගොස් තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත නිෂ්පාදනය වන කිලෝග්‍රෑම් 2,275,935 ක ප්‍රමාණය ළඟාකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

(iv) සංස්ථාවේ තේ වගාකර ඇති භූමි ප්‍රමාණය වන හෙක්ටයාර් 2,892 මගින් වාර්ෂිකව නිෂ්පාදනය කළ යුතු සම්මත නිමි තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් 5,023,695 ක් විය යුතු වුවත් එයින් සියයට 30 ක් හෙවත් කිලෝග්‍රෑම් 1,511,788 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

(ආ) 2014 හා සමාලෝචිත වර්ෂයේ බාහිර වැවිලිකරුවන් වෙත ලබාදී තිබූ භූමි ප්‍රමාණය හා ලබාගෙන තිබූ නිමි තේ නිෂ්පාදනය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2015 | | 2014 | |
|---|---|---|---|---|
| වතුයායේ නම | භූමි ප්‍රමාණය | නිමි තේ නිෂ්පාදිතය | භූමි ප්‍රමාණය | නිමි තේ නිෂ්පාදිතය |
| | (හෙක්ටයාර්) | (කිලෝග්‍රෑම්) | (හෙක්ටයාර්) | (කිලෝග්‍රෑම්) |
| අලගොල්ල | 56 | 6,384 | 56 | 6,765 |
| කොටගහ | 202 | 9,422 | 267 | 26,974 |
| ගෝමර | 76 | 7,841 | 76 | 12,633 |
| හාගල | 130 | 13,278 | 134 | 17,662 |
| හෙයාර්පාර්ක් | 156 | 23,244 | 17 | 32,529 |
| හුන්නස්ගිරිය | 17 | 1,750 | 144 | 1,960 |
| කැලෑබොක්ක | 128 | 23,740 | 128 | 15,282 |
| මිඩ්ලන්ඩ් | 27 | 2,742 | 27 | 3,030 |
| නිකොලොඔය | 40 | 1,632 | 40 | 2,090 |
| ඕපල්ගල | 52 | 1,825 | 52 | 1,717 |
| රංගල | 110 | 21,344 | 110 | 31,957 |
| **එකතුව** | **994** | **113,202** | **1,051** | **152,599** |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බාහිර වැවිලිකරුවන් විසින් 2014 වර්ෂයේදී සපයනු ලැබූ අමු තේ දළුවලට අදාල නිමි තේ නිෂ්පාදනය වූ කිලෝග්‍රෑම් 152,599 ක හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ නිමි තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 113,202 ක් වූයෙන් කිලෝග්‍රෑම් 39,397 කින් එනම් සියයට 26 කින් නිෂ්පාදනය පහළ ගොස් තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ බාහිර වැවිලිකරුවන් විසින් නඩත්තු කරනු ලබන සංස්ථාව සතු හෙක්ටයාර් 994 ක භූමි ප්‍රමාණය මඟින් වාර්ෂිකව නිෂ්පාදනය කළ යුතු නිමි තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් 1,727,818 ක් විය යුතු වුවත් ඉන් සියයට 7ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබූ භූමි ප්‍රමාණය පිළිබඳව කළමණාකාරීත්වයේ නිසි අධීක්ෂණයට ලක් නොවීම හේතුවෙන් උපරිම ඵලදායීතාවක් ලබා ගැනීමට නොහැකිව තිබූ අතර එය වැඩිදියුණු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් අනුගමනය කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී වතුයායන් 13ක් තම ඇස්තමේන්තුගත නිෂ්පාදන ඉලක්කවලට ළඟාවී නොතිබූ අතර වතුයායන් 5 ක තත්‍ය නිෂ්පාදනය ඉලක්ක ගත නිෂ්පාදනයෙන් සියයට 50 ක මට්ටමක පැවතුණි.

(ඈ) 2014 හා සමාලෝචිත වර්ෂයේ සංස්ථාව මඟින් පාලනය කරනු ලබන වතුයායන්හි තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය **(COP)** හා සාමාන්‍ය විකුණුම් වටිනාකම **(NSA)** පහත පරිදි වේ.

| වතුයායේ නම | 2015<br>නිෂ්පාදන පිරිවැය | <br>සාමාන්‍ය විකුණුම් වටිනාකම | <br>දායකය | 2014<br>නිෂ්පාදන පිරිවැය | <br>සාමාන්‍ය විකුණුම් වටිනාකම | <br>දායකය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අලකොල්ල | 382 | 252 | (130) | 345 | 270 | (75) |
| කොටගහ | 653 | 242 | (411) | 659 | 287 | (372) |
| ගල්පිල්ල | 332 | 252 | (80) | 317 | 269 | (48) |
| ගෝමර | 394 | 241 | (153) | 355 | 265 | (90) |
| හාගල | 394 | 238 | (156) | 353 | 284 | (69) |
| හෙයාර්පාර්ක් | 588 | 241 | (347) | 410 | 264 | (146) |
| හුන්නස්ගිරිය | 392 | 251 | (141) | 408 | 267 | (141) |
| කැලෑබොක්ක | 454 | 232 | (222) | 536 | 311 | (225) |
| මිඩ්ලන්ඩ් | 537 | 265 | (272) | 507 | 328 | (179) |
| නිකොලොඔය | 459 | 259 | (200) | 442 | 327 | (115) |
| ඕපල්ගල | 386 | 267 | (119) | 349 | 332 | (17) |
| රංගල | 450 | 243 | (207) | 461 | 277 | (184) |
| වලහන්දූව | 354 | 230 | (124) | 337 | 259 | (78) |

සංස්ථාවේ සෑම වතුයායකම තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය විකුණුම් මිල ඉක්මවූ නිෂ්පාදන පිරිවැයක් පවතින බව නිරීක්ෂණය විය. තවද 2014 වර්ෂයට සාපේක්ෂව වතුයායන් හතරක හැර අනෙකුත් වතුවල නිෂ්පාදන පිරිවැය වැඩි වී ඇති අතර සාමාන්‍ය විකුණුම් මිල අඩු වීම හේතුවෙන් සෑම වතුයායකම දායකත්වය ඍණ අගයක් ගෙන තිබුණි.

(ඉ) 2015 වර්ෂයට අදාලව සංස්ථාව මඟින් පාලනය කරනු ලබන වලහන්දූව වතුයායෙහි රබර් කිරි කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය (**COP**) හා සාමාන්‍ය විකුණුම් වටිනාකම (**NSA**) පහත පරිදි වේ.

| වර්ෂය | ඵලදාව | NSA | COP | ලාභය / (අලාභය) | වෙනත් ආදායම් |
|---|---|---|---|---|---|
| රු. | කිලෝග්‍රෑම් | රු. | රු. | රු. | රු. |
| 2010 | 50,165 | 364 | 206 | 7,971,169 | 758,257 |
| 2011 | 49,333 | 469 | 240 | 11,318,050 | 5,011,601 |
| 2012 | 39,219 | 378 | 289 | 3,405,404 | 352,698 |
| 2013 | 44,863 | 344 | 325 | 845,665 | 1,238,855 |
| 2014 | 40,741 | 259 | 337 | (3,097,683) | 295,148 |
| 2015 | 36,810 | 231 | 354 | (4,513,701) | 2,506,047 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2010 වර්ෂයේ රු. 7,971,169 ක්ව පැවති ලාභය සමාලෝචිත වර්ෂයේදී රු. 4,513,701 ක අලාභයක් දක්වා වර්ෂ 5ක් තුල සියයට 157 කින් පිරිහී තිබුණි. 2010 වර්ෂයට

සාපේක්ෂව රබර් එලදාව සියයට 27 කින් අඩු වීම හා කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය සියයට 72 කින් වැඩිවීම පිළිබඳව ඉහළ කළමණාකාරීත්වයේ අවධානය යොමු කර නොතිබුණි.

(ii) වයස අවුරුදු 25 ඉක්මවා තිබූ ගස් ප්‍රමාණය 9,700ක් වූ අතර එය මුළු ගස් ප්‍රමාණයෙන් සියයට 50 ක්වී තිබුණි. සියළුම ගස් අවුරුදු 19 ඉක්මවා තිබූ අතර 1996 වර්ෂයෙන් පසුව 2010 වර්ෂයේදී රබර් ගස් 1040 ක් පමණක් අලුතින් වගාකර තිබුණි.

(iii) වලහන්දූව වතුයායේ හෙක්ටයාරයක සාමාන්‍යයෙන් පැවතිය යුතු ඇස්තමේන්තුගත පැල ප්‍රමාණය 33,150 ක් වුවත් පැවති පැල ගණන 20,558 ක් හෙවත් සියයට 62 ක් විය.

(ඊ) 2014 වර්ෂය තුල ශ්‍රී ලංකාවේ හෙක්ටයාරයක සාමාන්‍ය රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 914 ක් වුවත් වලහන්දූව වතුයායේ සමාලෝචිත වර්ෂය තුලදී ලබාගත් සත්‍ය නිෂ්පාදනය කිලෝග්‍රෑම් 35,582 ක් වූයෙන් සාමාන්‍ය රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 547 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ඉහල කළමනාකාරීත්වයේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් 2003 ජූනි 17 දින සිට 2009 ඔක්තෝබර් 05 දක්වා මාස 74 ක කාලයක් සාධාරණ හේතු නොමැතිව වැඩ තහනමකට ලක් වූ නිලධාරිනියකගේ සේවය ආයතනය වෙත ලබා නොගෙන එම කාලය වෙනුවෙන් වැටුප් වශයෙන් රු. 611,284 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) 2012 මැයි 25 දින ගිනිගෙන විනාශ වූ අලකොල්ල තේ කර්මාන්තශාලාවේ අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු කිරීම වෙනුවෙන් හා අබලි ද්‍රව්‍ය ආරක්ෂා කිරීම සඳහා මුරකරුවන් යෙදවීම වෙනුවෙන් රු. 2,246,094 ක් වැයකර තිබුණ අතර මේ වනවිට එම කටයුතු සඳහා වසර තුනකටත් වඩා වැඩි කාලයක් ගතවී ඇතත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි . ඉදිරියේදි අබලි ද්‍රව්‍ය දිරාපත් වීම හේතුවෙන් සංස්ථාවට වැය වූ මුදල හෝ නොලැබීමේ අවධානමක් පවතින අතර තවදුරටත් මෙහි ආරක්ෂක කටයුතු වෙනුවෙන් වියදම් දැරීමට සිදුවීම සම්බන්ධයෙන් කලමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) 2013 ජූනි 07 දින ගින්නෙන් විනාශ වූ ගල්පීල්ල තේ කර්මාන්ත ශාලාවේ අබලි ද්‍රව්‍ය ඉවත් කිරිමට කටයුතු නොකිරීම හේතුවෙන් ඒවායේ ආරක්ෂාව සඳහා යෙදවූ මුරකරුවන් වෙනුවෙන් වැටුප් ලෙස 2014 හා සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසය තෙක් රු.1,130,077 ක් ගෙවා තිබුණි.

## 3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 අගෝස්තු මාසය තුලදී සිදුකරන ලද නියැදි පරික්ෂාවේදී මිඩ්ලන්ඩ් කර්මාන්තශාලාවේ නිපදවන ලද තේ කිලෝග්‍රෑම් 9,011 ක් යන්ත්‍රවල පවතින අකාර්යක්ෂමතාවය හේතුවෙන් දෙවරක් නිෂ්පාදන ක්‍රියාවලියට යොමු කිරීම තුලින් කර්මාන්තශාලා විදුලිය, වැටුප් හා අනෙකුත් වියදම්ද අතිරේකව දැරීමට සිදුවී තිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන අංශය විසින් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 4 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී කැලැබොක්ක තේ කර්මාන්ත ශාලාවේ රු.7,412,230 ක වටිනාකමක් සහිත පුළුස්සන ලද තේ කිලෝග්‍රෑම් (Bulk Tea) 31,770 ක් පැවතුණි. ආයතනය දැඩි මූල්‍ය අර්බුදයක පවතින අවස්ථාවකදී මෙලෙස තේ තොග රඳවා ගැනීම සුදුසු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වලහන්දූව වතුයාය තුල අළුතින් රබර් වගා කිරීම සඳහා බිම් සකස් කිරීම වෙනුවෙන් රු. 1,918,507 ක් හා ගම්මිරිස් පැල 250 ක් සිටුවීම වෙනුවෙන් රු.59,410 ක් වැයකර තිබුණද පැල සිටුවා නොතිබුණි.

## 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ කාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

වාර්ෂික විගණන සැලැස්ම අනුව වතුයායන් 14 ක්, ප්‍රාදේශීය කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ආවරණය කිරීමට සැලසුම්කර තිබුණද, ඉන් වතුයායන් 5 ක් හා ප්‍රධාන කාර්යාලයේ අංශ 2ක් පමණක් පරීක්ෂාකර තිබුණි. මේ අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් තම සැලසුම්ගත ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ලේඛන පාලනය | මූලාශ්‍ර ලේඛන නිසිපරිදි නඩත්තුකර නොතිබීම. |
| (ආ) | අයවැය පාලනය | අයවැයගත ඉලක්ක සපුරා නොගැනීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | කාර්යසාධනය වර්ධනය කර ගැනීමට අදාල තාක්ෂණික මෙවලම් හා ක්‍රියාවලීන් භාවිතා නොකිරීම. |
| (ඈ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන සැලැස්ම අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොකිරීම. |